# අ.පො.ස (උසස් පෙළ)

# ආර්ථික විද්‍යාව



## 6.0 සාවර් ආර්ථික සමතුලිතය තීරණය වන ආකාරය විග්‍රහ කරයි

### 6.1 සාවර් ආර්ථික සමතුලිතය සහ අසමතුලිතය විග්‍රහ කරයි

- **සාවර් ආර්ථික සමතුලිතය යන්න අර්ථ දක්වයි.**
- **සාවර් ආර්ථික අස්ථායිතාව යන්න අර්ථ දක්වයි.**
- **සාවර් ආර්ථික සමතුලිතය ඉදිරිපත් කළ හැකි විකල්ප ප්‍රවේශ පැහැදිලි කරයි.**

## සාවර් ආර්ථිකසමතුලිතය

- සමස්ත නිමවුමේ(AS) වටිනාකමට සමාන සමස්ත ඉල්ලුමක් (AD) පවතින අවස්ථාව සාවර් ආර්ථික සමතුලිතය ලෙසට හැඳින්වේ. මෙහිදී සමස්ත ඉල්ලුම (AD) සපුරාලීමට ප්‍රමාණවත් සමස්ත සැපයුමක් (AS) පවතී.
- සමස්ත ඉල්ලුම සපුරාලීමට සමස්ත සැපයුම ප්‍රමාණවත් නොවන අවස්ථාව සාවර් ආර්ථික අසමතුලිතයයි. මෙහිදී සමස්ත නිමැවුමත් සමස්ත සේවා නියුක්ති මට්ටමත් උච්චාවචනය වේ.
- ආර්ථික සමතුලිතයේ දී සමස්ත නිමැවුමත් සමස්ත සේවා නියුක්ති මට්ටමත් උච්චාවචනය නොවී, පවත්නා මට්ටමෙහිම පවතී.

සාවර් ආර්ථික සමතුලිතය ප්‍රවේශ තුනකට ඉදිරිපත් කළ හැකිය




සමතුලිතයක් ඇතිවීමට නම් විචල්‍යයන් වෙනස් නොවී පැවතිය යුතුය. ඒ අනුව සාවර් ආර්ථික සමතුලිතය ලෙසට සමාහාර ඉල්ලුම (AD)නැතහොත් සමාහාර වියදම (E) සමාහාර නිමවුම (AS) නැතහොත් සමාහාර ආදායමට (Y) සමාන වන අවස්ථාව (සමස්ත නිමැවුම නොවෙනස් ව තිබීමේ ප්‍රවණතාව) දැක්විය හැක.(AD=AS) (Y=E)

ඉහත ප්‍රවේශ 3 අනුව සාවර් ආර්ථික සමතුලිතය රූපසටහනක් මගින් ද දැක්විය හැක.

අන්තගර්තය -E.M.M.S.D ගෝමස් මිය - බප/ජය/ ධර්මපාල විද්‍යාලය
සැකසුම - ප්‍රදීප් මාධව එදිරිමුණි මයා ක/ ශ්‍රී නිශ්ශංක ජාතික පාසල
අන්තගර්තය පරික්ෂා කිරීම- ඩබ්ලිව්.ඊ.එම්.ඩී ලලිත් සමන්ත විජේසිංහ මයා - විද්‍යාරත්න විශ්ව විද්‍යා පීඨය- හොරණ

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## සාවර් ආර්ථිකසමතුලිතය

### 01 සමාහාර ආදායම් හා සමාහාර වියදම් ප්‍රවේශය (Y=E)




මෙම ප්‍රවේශය ඉදිරිපත් කර ඇත්තේ සුප්‍රකට ආර්ථික විද්‍යාඥයකු වූ මහාචාර්ය **ජෝන් මෙනාඩ් කේන්ස්** මහතා විසිනි.

0

සමාහාර ආදායමට (Y) වඩා සමාහාර වියදම (E) වැඩි වුවහොත් (Y<E) එය අසමතුලිත තත්ත්වයකි. මෙහිදී නිමැවුම අභිබවා (AS) ඉල්ලුමක් (AD) පවතින අතර ඉන් දිරිමත්වන නිෂ්පාදකයෝ නිෂ්පාදනය වැඩි කරති. එය ආර්ථිකයේ ප්‍රසාරණයක් ඇති කිරීමට හේතු වේ. ඉල්ලුමට සරිලන නිමැවුම ඇතිවන තෙක් ප්‍රසාරණය සිදුවේ.

එසේම ආදායමට (Y) වඩා වියදම (E) අඩු වුවහොත් (Y>E) නිෂ්පාදන තොග ගොඩගැසෙයි.ඉන් නිෂ්පාදකයෝ අධෛර්යමත් වී නිෂ්පාදනය අඩු කරති. එය සාවර් ආර්ථිකයේ සංකෝචනයට හේතුවෙයි. මෙම ක්‍රියාවලිය සමතුලිත මට්ටම දක්වා ක්‍රියාත්මක වේ.

අවසානයේ සමාහාර ආදායමට (Y) සමාහාර වියදම (E) සමාන වන අවස්ථාවේ ආර්ථිකයේ සමතුලිතය ඇති වේ. ඉහත ප්‍රස්තාරයේ E ලක්ෂයෙන් ආර්ථිකයේ සමතුලිත අවස්ථාව පෙන්නුම් කරයි. එය ආදායම් වියදම් ප්‍රවේශයයි.

### 02. කාන්දුවීම් විදීම් ප්‍රවේශය (W=J)

කිසියම් කාල පරිච්ඡේදයක් තුල, චක්‍රීය ආදායමේ වෘත්ත ප්‍රවාහයෙන් සිදුවන ගිලිහීම් (W) එකතුවීම්(J) සමාන වන අවස්ථාවේදී ද ආර්ථිකයේ සමතුලිතය දැකිය හැකි ය (W=J)




අන්තගර්තය -E.M.M.S.D ගෝමස් මිය - බප/ජය/ ධර්මපාල විද්‍යාලය
සැකසුම - ප්‍රදීප් මාධව එදිරිමුණි මයා කු/ ශ්‍රී නිශ්ශංක ජාතික පාසල
අන්තගර්තය පරික්ෂා කිරීම- ඩබ්ලිව්.ඊ.එම්.ඩී ලලිත් සමන්ත විජේසිංහ මයා - විද්‍යාරත්න විශ්ව විද්‍යා පීඨය- හොරණ

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## 03 සමාහාර ඉල්ලුම් - සැපයුම් ප්‍රවේශය (AD=AS)

සමාහාර ඉල්ලුම (AD) සමාහාර වියදමට (AS) සමාන වන අවස්ථාවේදී සාවර් ආර්ථික සමතුලිතය දක්වයි. එය පහත සඳහන් ආකාරයට ප්‍රස්තාර සටහනෙන් ඉදිරිපත් කළ හැකිය.




## සමාහාර ඉල්ලුම (AD) තුළ පහත සංරචක අඩංගු වේ.

- පෞද්ගලික පරිභෝජනය (C)
- රාජ්‍ය පරිභෝජනය (G)
- ආයෝජනය (I)
- අපනයනය (X)

භාණ්ඩ හා සේවා සඳහා කෙරෙන සමාහාර ඉල්ලුම පහත සමීකරණය දක්වයි

$$AD = C + I + G + X$$

අන්තගර්තය -E.M.M.S.D ගෝමස් මිය - බප/ජය/ ධමර්පාල විද්‍යාලය
සැකසුම - ප්‍රදීප් මාධව එදිරිමුණි මයා ක/ ශ්‍රී නිශ්ශංක ජාතික පාසල
අන්තගර්තය පරික්ෂා කිරීම- ඩබ්ලිව්.ඊ.එම්.ඩී ලලිත් සමන්ක විජේසිංහ මයා - විද්‍යාරත්න විශ්ව විද්‍යා පීඨය- හොරණ

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## සාවර් ආර්ථිකසමතුලිතය

### සමාහාර සැපයුම පහත සංරචක වලින් සමන්විතයි

- දේශීය භාණ්ඩ හා සේවා පරිභෝජනය (C)
- අනාගත පරිභෝජනයට වෙන්කරන කොටස නැතහොත් ඉතුරුම් (S)
- රජයට ගෙවන බදු (T)
- විදේශීය භාණ්ඩ හා සේවා පරිභෝජනය (M)

මේ අනුව ආර්ථිකයක සමාහාර සැපයුම පහත සමීකරණය දක්වයි

$$AS = C + S + T + M$$

මේ අනුව ආර්ථිකයක සමාහර ඉල්ලුම සමාහාර සැපයුමට සමාන වන අවස්ථාවේදී සාවර් ආර්ථික සමතුලිතය තීරණය වන බව තහවුරු වේ.

අන්තගර්තය -E.M.M.S.D ගෝමස් මිය - බප/ජය/ ධමර්පාල විද්‍යාලය
සැකසුම - ප්‍රදීප් මාධව එදිරිමුණි මයා ක/ ශ්‍රී නිශ්ශංක ජාතික පාසල
අන්තගර්තය පරික්ෂා කිරීම- ඩබ්ලිව්.ඊ.එම්.ඩී ලලිත් සමන්ක විජේසිංහ මයා - විද්‍යාරත්න විශ්ව විද්‍යා පීඨය- හොරණ

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk